Vidyodaya Journal of Humanities and Social Sciences

VJHSS (2023), Vol. 08 (01)

# Impact of Prisoner Population on the Prison Rehabilitation Process in Sri Lanka

R. G. Anuradha

Department of Criminology and Criminal Justice, University of Sri Jayewardenepura, Sri Lanka

**Article Info**

Article History:
Received 12 Sep 2022
Accepted 15 Oct 2022
Issue Published Online
01 January 2023

**Key Words:**
Rehabilitation system
Imprisonment
Overcrowding prisons
Prison institution
Punishment

*Corresponding author
E-mail address:
gayaniperara4@gmail.com

https://orcid.org/0000-0001-9489-1630

Journal homepage:
http://journals.sjp.ac.lk/index.php/vjhss

http://doi.org/10.31357/fhss/vjhss.v08i01.03

VJHSS (2023), Vol. 08 (01), pp. 39-48

ISSN 1391-1937/ISSN 2651-0367 (Online)

CC BY

Faculty of Humanities and Social Sciences 2023

## ABSTRACT

*Prison is one of the main and important agencies which involves in the criminal justice process. Offenders who are sentenced to imprisonment are sent to this institution for rehabilitation. The main objective of the prison institution is to rehabilitate prisoners thereby helping them to understand what was wrong with their behaviors and helping them to become productive citizens in the future after releasing from prison. In order to achieve this task, the prison system should take necessary steps to conduct an effective rehabilitation process during the imprisonment period. The study was based on to study the impact of the prisoners population on the prison rehabilitation process in Sri Lanka.. The objective of the research was to identify basic rehabilitation problems caused by the prisoners population. The research was conducted in Mahara prison in the Gampaha District of the western province. The study sample included 50 prisoners out of 1500 prisoners of Mahara prison. The sample was selected using systematic sampling which is one of the probability sampling methods used. And also prison officers were selected under the same sample. The data obtained from the research have been extensively analyzed quantitatively and qualitatively. The finding reveals that the physical and human resources in prisons are limited compared to the increasing number of prisoners, referrals from prisoners to vocational sectors have decreased, and 66% of prisoners have health problems. Meanwhile, there are sexually transmitted diseases and rashes. Furthermore, remanded prisoners have increased due to delays in cases. To increase the effectiveness of the rehabilitation process, the prisoner population must be controlled, for that, it is important to have an interconnection between the court and prison.*

**මාතෘකාව**

ශ්‍රී ලංකාවේ  බන්ධනාගාර පුනරුත්ථාපන ක්‍රියාවලිය කෙරෙහි සිරකරු ජනගහනයේ බලපෑම අධ්‍යයනය කිරීම

## 1. හැඳින්වීම

අපරාධ පාලනයෙහි හා නිවාරණයෙහි සඳහා කටයුතු කරන අපරාධ යුක්ති ක්‍රමයට සම්බන්ධ ප්‍රධාන කොටස් ලෙස නීතිය බලාත්මක කිරීම, අධිකරණය, හා විශෝධනය හැඳින්විය හැකිය. අධිකරණය මගින් කිසියම් පුද්ගලයෙකු කිසියම් වරදක් සම්බන්ධව චෝදනා ලැබ ඇති විටෙක ඔහු එම චෝදනාවට වරදකරු යැයි, තීරණය කිරීමෙන් අනතුරුව මෙන්ම ඔහු සම්බන්ධව තව දුරටත් විමර්ශනය කිරිම හෝ නඩු විභාග කරගෙන යා යුතු නිසා ඔහුට හෝ සමාජයට ආරක්ෂාව සැපයිය යුතු හෙයින් ඔහු රඳවා තබා ගත යුතු යැයි තීරණය වූ පසු එම කාර්යය පැවරෙන්නේ විශෝධනයටය. විශෝධන ආයතන අතුරින් බන්ධනාගාරය ප්‍රමුඛ වේ. ලෝකයේ සෑම රටකම වරදකරුවන් උදෙසා දඬුවම් කිරීමට, රඳවා තබා ගැනීමට, සිරගෙය තුළ තනි කොට සමාජීය වශයෙන් නිෂ්ක්‍රීය කිරිමට, පුනරුත්ථාපනය කිරීමට යන පරමාර්ථ පෙරදැරිව බන්ධනාගාර ස්ථාපිත කර ඇත. මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ සිරකරුවන්ගේ ජනගහනය මගින් බන්ධනාගාර පුනරුත්ථාපන ක්‍රියාවලිය තුළ සිදුවන පුනරුත්ථාපන ගැටලු හඳුනා ගැනීමය . එසේම අධ්‍යනයේ උප අරමුණු ලෙස බන්ධනාගාරය තුළ රැඳවියන් පුනරුත්ථාපනය කිරීම සඳහා භාවිත කරන ක්‍රමවේද? පිළිබඳව අධ්‍යයනය කිරීම, පුනරුත්ථාපන ක්‍රියාවලියෙන් සමාජයට සිදුවන බලපෑම අධ්‍යයනය කිරීම හා වර්තමාන පුනරුත්ථාපන ක්‍රියාවලියේ ඵලදායිතාව පිළිබඳ බන්ධනාගාර නිලධාරීන්ගේ අදහස් කෙසේද? යන්න අධ්‍යයනය කිරීමය. මේ සඳහා අධ්‍යයන අරමුණු මත පදනම් වෙමින් බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ මහර බන්ධනාගාරය අධ්‍යයන ක්ෂේත්‍රය ලෙස තෝරා ගන්නා ලදි.. නූතන බන්ධනාගාරයන් තුළ කාලීන ලෙස උද්ගත වී ඇති මූලික ගැටලුවක් වන සිරකරු ප්‍රජාව ඉහළ යාම උක්ත සඳහන් අරමුණු අභියෝගයට ලක් කර ඇත්තේ කෙසේද? යන්න අපරාධ විද්‍යාත්මක දෘෂ්ටිකෝණයෙන් අධ්‍යයනය කිරීම මෙහි පර්යේෂණාත්මක වැදගත්කම වේ.

වර්තමානය වන විට නූතන බන්ධනාගාර පද්ධතියේ මුඛ්‍ය අරමුණ වන්නේ පුනරුත්ථාපනයයි. ඒ අනුව රැඳවියන් උදෙසා බන්ධනාගාර තුළ ක්‍රියාත්මක වන පුනරුත්ථාපන ක්‍රියාවලිය යනු, වරදකරුවන් හට දඬුවම් දීම, ප්‍රජාවේ සමාජිකයන් ආරක්ෂා කිරීම, චරිත ශෝධනය කිරිම හා පුනර්සමාජගත කිරීමය. එසේම අපරාධකාරී ක්‍රියාවක ප්‍රතිඵලයක් ලෙස බන්ධනාගාරගත වන රැඳවියන් වඩා ඵලදායී පුනරුත්ථාපනයකට යොමු කිරීම උදෙසා ලෝක බන්ධනාගාරයන් "අවම සම්මත රෙගුලාසි මාලාවට" අනුගත වී ඇත. එසේම ශ්‍රී ලංකාවේ බන්ධනාගාර පද්ධතියද අවම සම්මත රෙගුලාසි මාලාවට අනුගත වෙමින් හා බන්ධනාගාර ආඥාපණතට අනුගත වෙමින් ක්‍රියාත්මක වේ. නමුත් මේ වන විට ලෝක බන්ධනාගාර පද්ධතිය තුළ අවම සම්මත රෙගුලාසි මාලාව අභියෝගයට ලක් කරමින් ගැටලු උද්ගත වී ඇත. ඒකී ගැටලු අතර මූලික ගැටලුව වන්නේ, සිරකරු ජනගහනය ශීඝ්‍ර ලෙස ඉහළ යාමය. ඊට අමතරව බන්ධනාගාර උප සංස්කෘතියක් නිර්මාණය වීම, කල්ලි ගැසීම, සෞඛ්‍ය හා මානසික ගැටලු, ජාතිවාදය, ප්‍රචණ්ඩකාරී හැසීරිම, සියදිවි නසා ගැනීම ආදිය හඳුන්වා දිය හැකිය. සිරකරු ජනගහනය වැඩි වීමේ මූලික ගැටලුව කෙරෙහි අවධානය යොමු කිරීමේදී ලෝකයේ බන්ධනාගාර ජනගහන ශ්‍රේණිගත කිරීම්වලට අනුව ලෝකයේ පළමු ස්ථානය පසු වන්නේ ඇමරිකාවයි. එරට බන්ධනාගාර ජනගහනය 2,121 600ක් වේ. දෙවන ස්ථානයේ පසු වන්නේ චීනයයි. එරට අගය 1,649 804 කි. ශ්‍රී ලංකාව මෙම ශ්‍රේණිගත කිරීම් අනුව 67 වන ස්ථානයේ පසුවෙයි (Punjab Prison, 2018). ලෝකයේ සිරකරුවන් උදෙසා ක්‍රියාත්මක විය යුතු මූලික මූලධර්ම කීපයක් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් සංවිධානය මගින් ඉදිරිපත් කර ඇත. ඒවා අතරින් කිහිපයක් ලෙස, මනුෂ්‍යයෙකු වශයෙන් සියලුම සිරකරුවන්ගේ ගරුත්වය සැළකිල්ලට ගත යුතුය, වර්ණය, ලිංගිකත්වය, භාෂාව, ආගම, දේශපාලනය, හෝ අනෙකුත් මතවාද, ජාතිය, දේපල, උපත හෝ අනෙකුත් සමාජ තත්ත්වයන් ආදි සාධක මත රැඳවියන් දෙවෙනි කොට සැලකීම නොකළ යුතුය. සිරකරුවන් අයත්වන කණ්ඩායමේ ආගමික විශ්වාසයන්, සංස්කෘතික ශික්ෂාවන්ට ගරු කළ යුතුය. සමාජයේ හා සියලු සමාජිකයන්ගේ ආරක්ෂාව උදෙසා රැඳවියන්ගේ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම බන්ධනාගාරවල වගකීම විය යුතුය (United Nations Human Rights Council, 1990).

දඟ ගෙවල් මගින් සිරකරුවන් පුනරුත්ථාපනය කිරීමට අසමත් වීම හේතුවෙන් චරිතශෝධනාගාර ආරම්භ වීමත් සමඟ 1870 දී ලොව බොහෝ රටවල බන්ධනාගාර තුළ සිරකරුවන් පුනරුත්ථාපනය පිළිබඳ ධනාත්මක අදහස් ගොඩනැගිණි. එහිදි පුනරුත්ථාපන වැඩසටහන් ලෙස අධ්‍යාපනික මෙන්ම වෘත්තීමය පුහුණු වැඩසටහන් කෙරෙහි සිරකරුවන් යොමු කරන ලදි (ජයසුන්දර, 2015). ඇමරිකාවේ කැලිෆෝනියා බන්ධනාගාරවල රැඳවියන් උදෙසා පවතින ආයතනික වැඩසටහන් ලෙස, මානසික ව්‍යාකූලතා සඳහා පුනරුත්ථාපනය, රැඳවියන්ට වෘත්තීමය මාර්ගෝපදේශනය ලබා දීම, තාක්ෂණික දැනුම, ක්‍රීඩා හා සෞඛ්‍ය දැනුම, හා අධ්‍යාපනික දැනුම ලබා දීම සිදු වේ. එසේම රැඳවියන් උදෙසාම නිර්මාණය වු පාසල් පවතින අතර එහි නියමිත කාලසටහන් ක්‍රමයක් පවතී. එමගින් බන්ධනාගාරගත වූවන්ට තම ගිලිහුණු අධ්‍යාපනය නැවත ලබා ගැනීමට අවස්ථාවක් ලබා දෙයි. රැඳවියන් සිරකුටි තුළ ගත කරන කාලය අවම කිරීම හා නිවැරදි පෞරුෂ සංවර්ධනය උදෙසා ක්‍රීඩා හා සෞඛ්‍ය දැනුම ද ලැබෙනු ඇත (Jonathan & Lee, 2017). ලෝකයේ බොහෝ රටවල වර්තමානය වන විට බන්ධනාගාරගත කිරීම අවම කිරීම සඳහා මෙන්ම පුනර් බන්ධනාගාරගත වීම වැළැක්වීම සඳහා වඩා මානව හිතවාදී ක්‍රමවේදයන් අනුගමනය

කරයි. ඒ සඳහා බන්ධනාගාර තුළ ආවෘත පරිසරය වෙනස් කිරීම හා සිවිල් ප්‍රතිකර්ම යෙදීම සිදු වේ. නෙදර්ලන්තය තුළ ඇති බන්ධනාගාරයන් වඩා ආරක්ෂාව සහිත හා මානුෂීය ගුණාංග වලින් පරිපූර්ණ වූ චරිතශෝධනාගාරයන්ය. එරට රැඳවියන්ගේ සාර්ථක පුනර් සමාජගත වීමක් උදෙසා අනුගමනය කරන ක්‍රමවේදයන් ලෙස, සිරකරුවන්ට අනුමත කරන ලද අමුත්තන් (සැමියා හෝ බිරිඳ) සමඟ ලිංගික කටයුතු වල නිරත වීම සඳහා විශේෂ අමුත්තන්ගේ කාමර පහසුකම්, බන්ධනාගාරයන්ට හුරු වීමේ උත්සාහයක් ලෙස සිරකරුවන්ට ඔවුන්ගේ ඇඳුම් ඇඳීමට අවසරය, සිරකරුවන්ට ඡන්දය ලබා දීමට පූර්ණ අයිතිය, සිරකරුවන්ට දුරකථන පහසුකම්, සුරතල් සතුන් තබා ගැනීමේ පූර්ණ නිදහස හා. ජනමාධ්‍යයට අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය ලබා දී ඇත (Stephen, 1991).

ශ්‍රී ලංකාවේ බන්ධනාගාර ආශ්‍රිත පුනරුත්ථාපන ක්‍රියාවලිය කෙරහි අවධානය යොමු කිරීමේ දී රැඳවියන්ගේ ආකල්ප හා චර්යාව වෙනස් කරමින් අගනාකමින් යුත් පුද්ගලයන් බිහි කිරීම උදෙසා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක වේ. එහිදි සිදුවන වෘත්තීය පුහුණුව ලබා දීම මගින් බන්ධනාගාරගත රැඳවියන් නැවත සමාජයට අනුගත වීමේදි, රැකියා අවස්ථා ලබා ගැනීම සඳහා මෙම වෘත්තීය පුහුණුව මනා ලෙස ඉවහල් වේ. එසේම දඬුවම් කාලයේදි රැඳවියන් බන්ධනාගාරයේ සිට විවිධ වෘත්තීය ක්ෂේත්‍රයන්වල නියැලීමේ ප්‍රතිඵලයක් ලෙස ඔවුන්ට දවසේ ආදායම් වශයෙන් ලැබෙන මුදල බැංකු ගිණුමට බැර කිරීමේ ක්‍රමවේදයක් මේ වන විට වැලිකඩ බන්ධනාගාරය තුළින් ආරම්භ වී ඇත. එසේම රැඳවියන් කුමන හෝ ආකාරයක වෘත්තීයයක නියැලීමේදි ඔහු හුදෙකලාව සිරකුටිය තුළ කාලය ගත කරන ප්‍රමාණය අවම වීම මත ඔහුගේ අපරාධකාරී චින්තනයන් හීන වෙනු ඇත (Karunarathne, 2015). සාපරාධි ක්‍රියාවක ප්‍රතිඵලයක් ලෙස අපරාධ යුක්ති පද්ධතිය හමුවේ ආයතනික විශෝධනයට ලක්වන වරදකරුවන් අතුරින් බන්ධනාගාරගත කිරීමට ලක්වන අපරාධකරුවන් තම දණ්ඩන සීමාව අවසන් වීමට පෙර යහපත් චර්යාත්මක පැවැත්ම මත, ඔහුගේ දණ්ඩන කාල සීමාව අවම වේ. ලාංකේය බන්ධනාගාර පද්ධතිය තුළ එලෙස දණ්ඩන කාල සීමාවට පෙර රැඳවියන්ට සමාජගත වීමට අවස්ථාව සැළසෙන්නේ බලපත්‍ර මත නිදහස් වීම, නිවාස නිවාඩු ලැබීම හා වැඩ සහන ලැබීම යන ක්‍රමවේද මගිනි (ප්‍රජා පාදක විශෝධන පනත, 1999).

කාලානුරූපීව සමාජය සංකීර්ණ වීමත් සමඟ බන්ධනාගාර ආශ්‍රිතව විවිධාකාරයේ ගැටලු රැසක් නිර්මාණය වී පවතින බව විවිධ පර්යේෂකයන් තම පර්යේෂණ මගින් තහවුරු කර ඇත. ලොව පුරා විහිදී ඇති බොහෝ බන්ධනාගාරවල ප්‍රධානම ගැටලුව වන්නේ, බන්ධනාගාර අධිගහනයයි.කැලිෆෝනියාවේ බන්ධනාගාර ආශ්‍රිතව දක්නට ලැබෙන ප්‍රධානම ගැටලු වන්නේ බන්ධනාගාර රැඳවියන්ගේ අධිගහනයයි. 1982 වසරේ සිට 2000 වසර වන විට කැලිෆෝනියාවේ බන්ධනාගාර අධිග්‍රහණ ප්‍රතිශතය 500% රැඳවියන්ගේ පහසුකම් සඳහා පුනරුත්ථාපන සඳහා රජය වෙන් කළ යුතු ප්‍රතිපාදන 144% ක් වන අතර එය එරට උසස් අධ්‍යාපනය සඳහා වෙන් කළ මුදලට සමාන වේ. එමෙන්ම මෙම අධිගහනය වැඩි වීමට හේතුව වන්නේ එරට අපරාධකරුවන් 8% ක් නිදහස ලබා වසර 03ක් ඇතුළත නැවත වරදක් කර බන්ධනාගාරගත වීමය (Karunarathne, 2015:10 ). ලෝක බන්ධනාගාර ජනගහන ශ්‍රේණිගත කිරීම් වලට අනුව ලෝකයේ පළමු ස්ථානයේ පසු වන්නේ ඇමෙරිකාවයි. ඒ අනුව වරදකරුවන් නිදහස් වී යන ප්‍රමාණයට වඩා නැවත බන්ධනාගාරගත වන ප්‍රමාණය ඉතාම ඉහළ අගයක් ගනි. එලෙස සිරකරු ප්‍රජාව ඉහළ යාමට මූලිකම හේතු සාධකය වී ඇත්තේ, සුළු වැරදි සඳහා රැඳවියන් අත්අඩංගුවට ගන්නා ප්‍රමාණය වැඩි වීම හා සමාජයේ පවතින අසමතුලිතතාවය මත ආර්ථිකය ශක්තිමත් නොවූවන් හා අඩු අධ්‍යාපනික පසුබිමක් ඇති වූවන්ගේ අපරාධකාරිත්වය වැඩි වීම මතය (Jonathan & Lee, 2017).මෙලෙස රැඳවියන් විවිධ හේතු මත නැවත නැවත බන්ධනාගාරගත වීම සිදුවන අතර එයට හේතු අධ්‍යයනය කරන දේශීය පර්යේෂණ මගින් දර්ද්‍රතාවය, අධ්‍යාපන මට්ටම අඩුකම, සමාජ පරිසරය ආදී සාධක බලපාන බව අවධාරණය කර ඇත (Karunarathne, 2015).

ශ්‍රී ලංකාවේ සිරකරුවන් බන්ධනාගාරගත කරනුයේ රිමාන්ඩ් සිරකරුවන් හා දඬුවම් විඳින සිරකරුවන් යන දෙයාකාරයටය. වර්තමානයේ බන්ධනාගාර පරිපාලනයේ හා ඊට අදාළ සෙසු අංශ මෙන්ම බන්ධනාගාර පුනරුත්ථාපන ක්‍රියාවලිය තුළ ඇති වී ඇති ප්‍රබල ගැටලුව වන්නේ මේ දෙයාකාර රැඳවියන් ප්‍රමාණය අධික වීමය (උදයකුමාර, 2016). මේ තත්ත්වය මත අද වන විට සිරකරුවන්ට සැලකීමේ අවම සම්මත රෙගුලාසි මාලාවද අභියෝගයට ලක් වී ඇත. සිරකරු ජනගහනය ඉහළ යාම පිළිබඳව සලකා බැලීමේදී රිමාන්ඩ් සිරකරු සංඛ්‍යාව ඉහළ යාම වර්තමානයේ ප්‍රධානම ගැටලුවකි. ඒ සඳහා හේතු පාදක වන ප්‍රබලම කරුණ වී ඇත්තේ අධිකරණය මඟින් නඩු විසඳීමේදී ඇති වන ප්‍රමාදයන්ය. එහිදී නඩු කටයුතු අවසන් වන තෙක්ම රිමාන්ඩ් සිරකරුවන් රඳවා තැබීම උදෙසා නිශ්චිත අධිකරණ ඇත්තේ සුළු ප්‍රමාණයකි. මේ නිසා වරදකරුවන් බවට පත් වූ පුද්ගලයන් සඳහා ඇති ඉඩකඩ රිමාන්ඩ් සිරකරුවන්ට යොදා ගැනීම මත නිතැතින්ම සිරකරු ජනගහනය ඉහළ යයි. බන්ධනාගාරගත වන පුද්ගලයන්ගේ තදබදය පිළිබඳව පැහැදිළි විශ්ලේෂණයක් බන්ධනාගාර පාලන වාර්තාව මගින් ඉදිරිපත් කරයි. එහිදි සඳහන් වන්නේ ඉතා සුළු වැරදි සඳහා අත්තඩංගුවට පත් වන පුද්ගලයන් කෙටි කලකට බන්ධනාගාරගත කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ඔවුන්ට වරදකරුවන් සමඟ මුසු වීමට සිදුවීම මත අදාළ පුද්ගලයන් නිතැතින්ම අපරාධකරුවන් බවට පත් වන බවය (බන්ධනාගාර පාලන වාර්තාව, 2018). දඬුවම් විඳින සිරකරුවන්ට

සාපේක්ෂව රිමාන්ඩ්ගත වන සැකකරුවන් ප්‍රමාණය වැඩි වීම සඳහා බලපාන තවත් හේතු ලෙස චූදිතයන් වශයෙන් පොලීසිය විසින් අධිකරණය වෙත ඉදිරිපත් කරන පුද්ගලයින් සඳහා අධික ලෙස ඇප මුදල් නියම කිරීම හා ඇප මුදල් ගෙවා ගත නොහැකිව රිමාන්ඩ් භාරයට පත්වන පිරිස ක්‍රමයෙන් ඉහළ යාම, සුළු වැරදි සඳහා අත්අඩංගුවට ගන්නා සැකකරුවන් රිමාන්ඩ් භාරයට පත් කිරීම,. ගණිකාවන් සහ ආයාලේ යන්නන් අත්අඩංගුවට ගැනීම, මත්ද්‍රව්‍ය භාවිතය සඳහා ඇබ්බැහි වූවන් හා බීමත් පුද්ගලයින් මෙසේ රිමාන්ඩ් සිරකරුවන් ලෙස බන්ධනාගාරගත වන පිරිසට එක් වේ. එසේම දැනට පවතින බන්ධනාගාර ගොඩනැගිලිවල ඉඩකඩ වර්ධනය වන ජනගහනයට හා ඉතා ශීඝ්‍රයෙන් ඉහළ යන අපරාධවලට සාපේක්ෂව වරදකරුවන් රැඳවීමට තරම් ප්‍රමාණවත් නොවීම ද සිරකරු අධිගහනය සඳහා හේතු වේ (උදයකුමාර, 2016).

සිරකරු අධිගහනය  බන්ධනාගාරය තුළ ව්‍යුත්පන්න ගැටලු රාශියක් ඇති කරන අතර එම ගැටලු අතරින් රැඳවියන්ගේ පුනරුත්ථාපන ක්‍රියාවලියට සිදු කරන බලපෑම සුවිශේෂී වේ. එලෙස සිරකරු ජනගහනය වැඩිවීම මත බන්ධනාගාර තුළ ඇති වන ගැටලු පිළිබඳ  විවිධ පර්යේෂකයන් විසින් පර්යේෂණයට ලක් කර ඇත. ආජන්ටිනාවේ බන්ධනාගාරවල අධිගහනය හේතුවෙන් බන්ධනාගාර අභ්‍යන්තරය තුළ ප්‍රචණ්ඩකාරී ගැටලු ඇති වී ඇත. එසේම යම් අවස්ථාවන්වල බන්ධනාගාර පරිපාලනයටද මෙම ගැටලුකාරීත්වයන් මැඩ පැවැත්වීමට නොහැකි වීම මත, රැඳවියන් විවිධ බන්ධනාගාර වලට මාරු කිරීමට සිදු වී ඇත. මෙලෙස ඇතිවන ප්‍රචණ්ඩත්වය මත රැඳවියන්ගේ දණ්ඩන කාල සීමාවන් දීර්ඝ කිරීම මගින් සෙසු රැඳවියන් පාලනය කිරීමට පියවර ගෙන ඇත (Oscar, 2015:10). එසේම නෝර්වේ කොලින් බන්ධනාගාර තුළ සිදුකළ පර්යේෂණයකට අනුව එහි මත්ද්‍රව්‍ය භාවිතය උග්‍ර ගැටලුවක් බවට පත් වී ඇත.එයට සෘජුලෙසම සිරකරු තදබදය හේතුවක් වී ඇත.  එසේම එම බන්ධනාගාර උපසංස්කෘතිය තුළ මත්ද්‍රව්‍ය විකිණීම වෙනුවට රැඳවියන් අතර බෙදා හදා ගැනීමේ ක්‍රියාවලියක් පවතී. රැඳවියන් බැලීමට බාහිරින් පැමිණෙන පිරිසක් විසින් ඔවුන්ට මෙම මත්ද්‍රව්‍ය සපයන අතර එය කල්ලි නායකයාගේ අනුදැනුම මත සිදු වේ. එසේම සෞඛ්‍ය නිලධාරීන් මගින් ලබාදෙන Bupernorphine නම් ඖෂධ ලබා ගැනීමෙන් මත්භාවයට පත් වීම හේතුවෙන් එම ඖෂධය ලබා දෙන රෝගීන් එය අනෙක් රැඳවියන් සමඟ බෙදා ගැනීම සිදු කරයි. මීට අමතරව ඇමරිකා එක්සත් ජනපදයේ බන්ධනාගාර ආශ්‍රිතව මත්පැන් භාවිතය නිසා ඇතිවන ගැටලු අතර 73% ක ප්‍රතිශතයක් එය භාවිතයට ගන්නා අතර අවුරුදු 18 - 24 ත් හා අවුරුදු 40 -  64 ත් අතර රැඳවියන් ආශ්‍රයේ මෙම ගැටලුව බහුලවම දක්නට ලැබෙයි (Kristine, 2015). බන්ධනාගාරගත රැඳවියන් තුළ බොහෝ මානසික ගැටලු ඇති වන අතර එලෙස ඇති වීම සඳහා ඔවුන් සිටින පරිසරයේ බාහිර හා අභ්‍යන්තරික සාධක බලපෑම් කරයි. සිරකරුවන් අතර මානසික සෞඛ්‍ය අක්‍රමිතා, ස්නායු ආබාධ, විශාදය, භීතිකාව, ආතතිය වැනි සංකූලතාවන් දක්නට ලැබේ. එය බන්ධනාගාර පරිපාලනයට හා රැඳවියන්ගේ පුනර්සමාජගත වීමට බලපෑම් කරන සෘණාත්මක මනෝවිද්‍යා ප්‍රතිඵල වේ (Ejibunu, 2013). රැඳවියන් බන්ධනාගාරානුයෝජනය වීම මත ඔවුන් තුළ ප්‍රචණ්ඩත්වය, අවිධිමත් ලිංගික සම්බන්ධතා, මත්ද්‍රව්‍ය භාවිතය, සෞඛ්‍ය ගැටලු හා රැඳවියන්ගේ යටිතල පහසුකම් ගැටලු ඇති වේ. බන්ධනාගාරානුයෝජනය වීම මත එහි නිර්මාණය වන උපසංස්කෘතිය බන්ධනාගාර පරිපාලනමය ගැටලු ඇති කරයි. මේකී සියලු ගැටලුකාරීත්වයන්ට හේතු වන්නේ සිරකරු ප්‍රජාව ශීඝ්‍රයෙන් ඉහළ යාමය. ඒ අනුව බන්ධනාගාගත වීම මත රැඳවියන්ට කිසිදු ආයෝජනයක්  සිදු නොවේ (Reid, 2012: 5).එසේම ශ්‍රී ලාංකේය බන්ධනාගාර පද්ධතිය තුළ ඇතිවන ගැටලූන් පිළිබඳව සිදුකරන ලද පර්යේෂයන් මගින් තහවුරු කොට ඇත්තේ, මෙරට රැඳවියන්ගේ අධිගහනය ව්‍යුත්පන්න ගැටලු රාශියක් නිර්මාණය කරන බවය (දස්කොන් සහ පෙරේරා, 2017). බන්ධනාගාරගත රැඳවියන්ගේ අධිගහනය මත නිර්මාණය වන ගැටලු අතර මෙරට රැඳවියන්ගේ සෞඛ්‍ය හා සනීපාරක්ෂක ගැටලු ප්‍රධානය. එහිදී ප්‍රමාණවත් ජල පහසුකම් නොමැති වීම, වැසිකිළි පහසුකම් නොමැති වීම, ඇඳ ඇතිරිලි ආදී අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ප්‍රමාණවත් නෙවීම, එක් සිරකරුවෙකු රැඳවිය හැකි සිර මැදිරියක රැඳවියන් 3-8 ප්‍රමාණයක් රදවා සිටිම, රාත්‍රීකාලයේදී මැදිරිවල ඇති පනිට්ටු හා බෝතල් වලට වැසිකිලි යාම, අවිධිමත් ලිංගික හැසිරීම් අදී හේතු ගණනාවක් ලංකාවේ බන්ධනාගාර පද්ධතියේ පුනරුත්ථාපන ක්‍රියාවලිය, පරිපාලනය, සිරකරුවන්ගේ මූලික අවශ්‍යතා සපයා දීම අභියෝගයට ලක් කරයි (දස්කොන් සහ පෙරේරා, 2017; Jeewanthi, 2015). පර්යේෂකයන් සිය පර්යේෂණ මගින් අවධානයට ලක්කර ඇත්තේ, සිරකරු ජනගහනය වැඩිවීම උපසංස්කෘතියක් නිර්මාණය කරන ආකාරයට හා සෞඛ්‍ය ගැටලු ඇතිවන ආකාරය අධ්‍යයනයටය. එහිදි ඇතැම් පර්යේෂකයන් සිරකරු අධිගහනය රැඳවියන්ගේ පුනරුත්ථාපනයට බලපෑම් කරන බව හඳුනා ගෙන ඇත. පුනරුත්ථාපන ගැටලු යනු හුදෙක්ම සෞඛ්‍ය හෝ උපසංස්කෘතික ගැටලු පමණක් නොව. එය වරදකරුවන් හට දඬුවම් දීම, සමාජය අපරාධකරුගෙන් ආරක්ෂා කිරීම, චරිතශෝධනය කිරිම හා වෘත්තීය පුහුණුව, අධ්‍යාත්මික දියුණුව, සෞන්දර්යය හා කලාව දියුණුව, අධ්‍යාපනය ලබා දීම, අකල්ප දියුණුව, සෞඛ්‍ය හා සනීපාරක්ෂාව ලබා දීම යන සංකීර්ණ ක්‍රියාවලියකි.

## 2 පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණයෙහි අරමුණු මත පදනම් වෙමින් තෝරා ගන්නා ලද අධ්‍යයන ක්ෂේත්‍රය වන්නේ, බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ පිහිටි මහර

බන්ධනාගාරයයි. ක්‍රි.ව 1870 බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී යුගයේ යෝජනාවකට අනුව ක්‍රි.ව 1875 දී මහර බන්ධනාගාරය ස්ථාපනය විය. වර්තමානය වන විට මහර බන්ධනාගාරය තුළ දඬුවම් විඳින සිරකරුවන් හා සැකකරුවන් යන දෙයාකාර රැඳවියන් රඳවා තබා ඇත. ඒ අනුව මෙහි සිටින 1850ක සිරකරු ප්‍රජාවකින් 511 දෙනෙක් දඬුවම් විඳින රැඳවියන් වන අතර සැකකරුවන් සංඛ්‍යාව 1202 කි. එමෙන්ම ඇපිල් සිරකරුවන් 42 ක්ද මරණීය දණ්ඩනය හා ජීවිතාන්තය දක්වා සිරගත වූවන් 76 ක් ද රඳවා සිටිති. එසේම මහර බන්ධනාගාරය තුළ වර්තමානය වන විට සිරකරුවන් පාලනය කිරිම සඳහා සමස්ත නිලධාරීන් 110 ක දෙනෙක් සේවයේ නිරත වී සිටිති. එකී නිලධාරී සියලු දෙනා ප්‍රධාන අධිකාරීවරයෙකු යටතේ සේවයේ නිරතවන අතර අධිකාරීවරයාට සහය වීම සඳහා සහකාර අධිකාරීවරුන් දෙදෙනෙකුද මෙහි සේවයේ නිරත වේ. මෙම පර්යේෂණය සඳහා අවශ්‍ය නියැදිය තෝරා ගැනීමේදී අධ්‍යයනයේ සංගහනය වන මහර බන්ධනාගාරයේ බන්ධනාගාරගත රැඳවියන් 1500 ක සංගහනයකින් 50 ක නියැදියක් සම්භාවිතාමය නියැදිය යටතේ ඇති ක්‍රමාන්විත නියැදිය මගින් තෝරා ගන්නා ලදි.

50/1500 - 1/ 30

එමෙන්ම පර්යේෂණයේ ප්‍රධාන අරමුණු තව දුරටත් සාක්ෂාත් කර ගැනීම සඳහා සම්භාවිතා නියැදි ක්‍රමයේ පවතින ක්‍රමාන්විත නියැදිය මගින්ම බන්ධනාගාර නිලධාරීන් තෝරා ගන්නා ලදි. මේ යටතේ බන්ධනාගාර නියාමක නිලධාරි 3 ක්ද, ජේලර්වරු 4ක්ද , පුනරුත්ථාපන නිලධාරී 3 ක්ද තෝරා ගන්නා ලදි.

10/100 -1/ 10

මෙම පර්යේෂණයේදී ප්‍රාථමික මූලාශ්‍ර හා ද්විතීයික මූලාශ්‍ර යටතේ දත්ත රැස් කිරීම සිදුකරන ලදි. ප්‍රාථමික මූලාශ්‍ර යටතේ භාවිතයට ගනු ලැබූ ක්‍රම ශිල්ප වූයේ, ආකෘතිමය සම්මුඛ සාකච්ඡා, අර්ධ ආකෘතිමය සම්මුඛ සාකච්ඡා, යන ක්‍රම ශිල්පයන්ය.. මෙම පර්යේෂණයේ දත්ත විශ්ලේෂණය ප්‍රධාන අංශ 2ක් යටතේ සිදු කරන ලදි. එහිදි ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණය හා ගුණාත්මක දත්ත විශ්ලේෂණය භාවිත කරන ලදි.

## 3. ප්‍රතිඵල හා සාකච්ඡාව

මෙහිදි සම්මුඛ සාකච්ඡා ක්‍රමය යටතේ පවතින ආකෘතිමය සම්මුඛ සාකච්ඡා ක්‍රමය බන්ධනාගාරගත රැඳවියන්ගේ දත්ත ලබා ගැනීම සඳහා භාවිත කරන ලදි. එහිදි ප්‍රශ්නාවලී ආකෘතියෙන් පරිබාහිරව කිසිදු ප්‍රශ්නයක් ඔවුන් වෙත යොමු නොකරන ලදි. එසේම අර්ධ ආකෘතිමය සම්මුඛ සාකච්ඡා ක්‍රමය තුළින් නිශ්චිත මෙන්ම ප්‍රධාන ප්‍රශ්න හැම අවස්ථාවකදීම පිළිවෙළකට අසන ලදි. සෙසු ප්‍රශ්න වල පිළිවෙළ වෙනස්කර අවශ්‍ය පරිදි වඩාත් ඵලදායී ලෙස පිළිතුරු ලබා ගැනීම සිදුකරන ලදි. එහිදි ප්‍රශ්න වලට පිළිතුරු ලබා දීමට නිදහස ඇති බැවින් මෙම ක්‍රමය නිලධාරීන් සඳහා ද යොදා ගන්නා ලදි.

රැඳවියන්ගේ වයස් කාණ්ඩ අනුව ලබා ගත් දත්තයන් විශ්ලේෂණය කිරීමේදි වයස අවුරුදු 29-39 ත් අතර සිටින රැඳවියන්ගේ ප්‍රමාණය 50% ක ප්‍රතිශතයක් නියෝජනය වේ. වයස අවුරුදු 18-28 ත් හා අවුරුදු 61 ට වැඩි රැඳවියන්ගේ ප්‍රතිශතය 10%කි. අවුරුදු 40-50 ත් අතර වයස් කාණ්ඩ වල පසුවන රැඳවියන් ප්‍රමාණය 22%ක් වන අතර වයස අවුරුදු 51-60 ත් අතර සිටින රැඳවියන්ගේ ප්‍රතිශතය 12% කි. රැඳවියන්ගේ ජාතිය අනුව ලබා ගත් දත්ත වලට අනුව 66% ක ප්‍රමාණයක් සිංහල ජාතික පුද්ගලයන් වූ අතර මුස්ලිම් ජාතිකයන් 20% ක් තෝරා ගත් නියැදිය තුළ නියෝජනය වේ. වෙනත් ජාතීන්ගේ නියෝජනය යටතේ 10% ක ප්‍රතිශතයක් ඇති අතර එමගින් මැලේ ජාතිකයන් තිදෙනෙක්ද, ඉන්දියන් ජාතිකයන් දෙදෙනෙක්ද , නියෝජනය වේ. තෝරා ගත් නියැදියට අනුව අවම ප්‍රතිශතයක් වාර්තා වන්නේ දෙමළ ජාතිකයන්ය. ලබා ගත් දත්තවලට අනුව වැඩිම ප්‍රතිශතයක් වාර්තා වන්නේ අවිවාහක පුද්ගලයන්ය. ඒ 44% කි. දික්කසාද වූවන්ගේ ප්‍රතිශතය 12% කි. විවාහක වූවන් 38% ක් වන අතර වෙනත් ක්‍රම යටතේ විවාහ නොවී එකට ජීවත්වන රැඳවියන් 1ක් අයෙක්ද දික්කසාද නොවී අත්හරින ලද පුද්ගලයන් දෙදෙනෙක්ද නියෝජනය වේ.රැඳවියන්ගේ අධ්‍යාපන මට්ටම සළකා බැලීමේදී වැඩි දෙනෙකුගේ අධ්‍යාපන මට්ටම වන්නේ 10 ශ්‍රේණියයි. එය 50% ක ප්‍රතිශතයකි . අවමය ලෙස වාර්තා වන්නේ පාසල් නොගිය හා උපාධිධාරී රැඳවියන්ය. එය 2%ක් වන අතර උපාධිධාරී රැඳවි පුද්ගලයා භික්ෂුවක් වීම මෙහිදි විශේෂ කොට දැක්විය හැකිය. 5 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය ලැබූ පුද්ගලයින්ගේ ප්‍රතිශතය 20%කි..උ.පෙළ තෙක් අධ්‍යාපනය ලැබූ පුද්ගලයන්ගේ ප්‍රතිශතය වන්නේ 10% කි. බන්ධනාගාරගත රැඳවියන් සිදු කරන ලද අපරාධ සළකා බැලීමේදි තෝරා ගනු ලැබූ නියැදියට අනුව වැඩිම අපරාධකාරීත්වයක් වාර්තා වන්නේ මත්ද්‍රව්‍ය සම්බන්ධවය. එහි වාර්තා වන ප්‍රතිශතය වන්නේ 38%කි. එහි විශේෂත්වය වන්නේ වාර්තා වූ සියලු මත්ද්‍රව්‍ය අපරාධයන් හෙරොයින් සම්බන්ධවය. 26% ක ප්‍රතිශතයක් මිනී මැරුම් සම්බන්ධ අපරාධ වන අතර මංකොල්ල සම්බන්ධ අපරාධයන් වාර්තා වන්නේ 24% ක ප්‍රතිශතයකි. ස්ත්‍රී දූෂණයන් 8%ක වැනි අවම ප්‍රතිශතයක් තෝරාගත් නියැදියට අනුව වාර්තා විය. වෙනත් අපරාධයන් 4% ක ප්‍රතිශතයක් වාර්තා වූ අතර ඒ යටතේ කාමුක දර්ශන අලෙවිය හා මූල්‍ය වංචාවන් නියෝජනය වේ. තෝරා ගත් නියැදියේ දත්තදායකයන්ට අනුව අපරාධයන් සිදුකරන ලද වාර ගණන සළකා බැලීමේදී අපරාධ සිදු කර ඇති වැඩිම වාර ගණන වන්නේ 2-5 දක්වා වාර අවස්ථාවන්ය. එය 48% ක ප්‍රතිශතයකි. එහිදි වැඩිම වාර ගණනක් සිදු කළ අපරාධ වර්ගයන් ලෙස


මංකොල්ල හා මත්ද්‍රව්‍ය සම්බන්ධ අපරාධයන් වාර්තා විය. 6 සිට ඉහළට සිදු කරන ලද අපරාධයන් වල්දී වැඩිම වාර ගණනක් සිදු කරන ලද අපරාධයක් වූයේ පුරාවස්තු මංකොල්ලයක්ය. එය අවස්ථා 150 කදී සිදුකරන ලද්දකි.

රැඳවියන්ගේ දණ්ඩන කාලසීමාව සළකා බැලීමේදී වැඩිම ප්‍රතිශතයක් වාර්තා වන්නේ අවුරුද්දකට වැඩි කාලසීමාවකට සිර දඬුවම් නියම වූ. ප්‍රතිශතයයි. එය 72%කි. මරණීය දණ්ඩනය නියම වූ පුද්ගලයන් හය දෙනාම (12%) මිනී මැරුම් සම්බන්ධ අපරාධ සිදු කර ඇති වීම මෙහිදි විශේෂය. ජීවිතාන්තය දක්වා සිරගතවීම 16% ක ප්‍රතිශතයකි. අධ්‍යයනයට භාජනය කළ නියදියේ ඇතුළත් රැඳවියන් විසින් සිදු කළ අපරාධ සඳහා ඉතා වැඩි බලපෑමක් සිදුකර ඇත්තේ මත්ද්‍රව්‍ය භාවිතයයි. එය සමස්ත ප්‍රතිශතයෙන් 42% කි. සමාන ප්‍රතිශත වාර්තා වන්නේ මානසික ආබාධ හා පළිගැනීමේ චේතනාව යටතේය. එනම් 6% ක ප්‍රතිශතයකි. පළිගැනීම මත සිදු වී ඇති අපරාධ අතුරින් ස්ත්‍රී දූෂණ 2ක් ඇතුළත්ය. වෙනත් හේතු යටතේ 4%ක ප්‍රතිශතයක් ඇති අතර එය ආශාව මත පමණක් පදනම් වී ඇත. දරිද්‍රතාවය 14%ක් වන අතර ඒ යටතේ මංකොල්ල 5ක් හා මත්ද්‍රව්‍ය අලෙවිය සම්බන්ධ අපරාධ 2 ක් ඇතුළත් වේ.පුනර්බන්ධනාගාරගත වීම සළකා බැලීමේදී රැඳවියන් මීට පෙර බන්ධනාගාරගත වීමේ ප්‍රතිශතයට වඩා වැඩි ප්‍රතිශතයක් වාර්තා වන්නේ බන්ධනාගාරගත නොවීම යටතේය. එය 62% ප්‍රතිශතයකි. බන්ධනාගාරගත වීම 38% කි. එහිදි පුනර් බන්ධනාගාරගත වීම සඳහා තෝරා ගත් නියැදියේ දත්ත වලට අනුව බලපාන ලද බහුල අපරාධයන් වන්නේ මංකොල්ල හා මත්ද්‍රව්‍ය සම්බන්ධ අපරාධයන්ය. දත්ත දායකයින්ගේ සිරකුටි තුළ සිටින රැඳවියන් සංඛ්‍යාව සළකා බැලීමේ දී සිරකුටි තුළ රැඳවියන් රඳවන සංඛ්‍යාව ඉහළ ගොස් ඇත.

මරණීය දණ්ඩනයට නියම වූ දත්තදායකයන්ගේ සිරමැදිරිවල පමණක් මෙම තත්ත්වය අවම මට්ටමක පවතී.

**වගු අංක 1.** දත්ත දායකයින්ගේ සිරකුටි තුළ සිටින රැඳවියන් සංඛ්‍යාව

| සිරමැදිරි වර්ගය | රැඳවිය හැකි උපරිම රැඳවියන් සංඛ්‍යාව | දැනට රඳවා ඇති සංඛ්‍යාව |
|---|---|---|
| සිරමැදිරි (මරණීය දණ්ඩනය සඳහා නියම වූ රැඳවියන්) | රැඳවියන් 3 | රැඳවියන් 3 |
| A වාට්ටුව | රැඳවියන් 100 | රැඳවියන් 150- 160 |
| B වාට්ටුව | රැඳවියන් 100 | රැඳවියන් 130- 150 |
| C වාට්ටුව | රැඳවියන් 150 | රැඳවියන් 200- 260 |
| D වාට්ටුව | රැඳවියන් 200 | රැඳවියන් 230- 250 |




**රූපසටහන 1.** සිරකුටිය තුළ ඉඩ ප්‍රමාණවත් නොවීම මත රැඳවියන්ට ඇති වන ගැටලු

උක්ත ප්‍රස්තාරයේ දැක්වෙන පරිදි අනුව රැඳවියන්ගෙන් ලබා ගන්නා දත්ත වලට අනුව සිරකුටිය තුළ ඉඩ ප්‍රමාණවත් නොවීම මත ඇති වන ගැටලුකාරීත්වය සම්බන්ධව 66% ක ප්‍රතිශතයකට පවතින ගැටලුව වන්නේ සෞඛ්‍ය සම්බන්ධ ගැටලුය. . ඒ යටතේ තෝරා ගත් දත්තදායකයන්ගේ මූලික සෞඛ්‍ය ගැටලු අතර දද, කුෂ්ඨ බෝ වීම, වෙනත් රෝග බෝ වීම, හුස්ම ගැනීමේ අපහසුතාවන් ඇති වීම, දහඩිය දැමීම, සිරකුටියට ලබා දෙන ජලය ප්‍රමාණවත් නොවීම ආදීයයි. වෙනත් ගැටලු 6% ක් වාර්තා වන අතර ඒ යටතේ හුදෙකලාව සිටින විට කල්ලි සමාජයෙන් ඇති වන බලපෑම නියෝජනය වේ. ප්‍රස්තාරගත දත්ත වලට අනුව මානසික ගැටලු 28% ක් වාර්තා වන අතර එයින් නින්ද පිළිබඳ ගැටලුව ප්‍රධාන වේ. බන්ධනාගාරයට අනුගත වීමේදී දත්තදායකයන්හට ඇති වූ බලපෑම් පිළිබඳ අධ්‍යයනයේදී පැරණි රැඳවියන්ගේ බලපෑම් එල්ල වීමේ ප්‍රතිශතය 72% කි. බලපෑම් එල්ල වීම යටතේ නිදාගැනීමට නොහැකි වීම හා තවත් පුද්ගලයෙකුට යටත් වීම හා ඔවුන්ගේ වැඩකටයුතු කිරීම ආදිය ඇතුළත් වේ. මත්ද්‍රව්‍ය භාවිතය සඳහා යොමු වීමේ ප්‍රතිශතය 60%කි. මත්ද්‍රව්‍ය සඳහා යොමු වීමේ ප්‍රතිශතය යටතේ භාවිතයට ගන්නා ලද මත්ද්‍රව්‍ය ලෙස දුම්කොළ ඔතන් බීම, මත්වන පුවක්, ගංජා භාවිතය ඇතුළත් වේ. දත්තදායකයින්ගේ සෞඛ්‍ය හා සනීපාරක්ෂක කටයුතු පිළිබඳ සළකා බැලීමේදී රැඳවියන්ට පවතින වැසිකිළි ප්‍රමාණවත් නොවීම සම්බන්ධව 80% ක ප්‍රතිශතයක් ඇත. වැසිකිළිවල පිරිසිදුභාවය සම්බන්ධව 76% ප්‍රතිශතයක් එකඟ වී ඇත. ස්නානය කිරීමේ නිදහස නොමැති වීම සමග 64% ක ප්‍රතිශතයක් එකඟ වේ. ආහාර ප්‍රමාණවත්ව ලැබීම සම්බන්ධව 72%ක ප්‍රතිශතයක් ඇති අතර රෝග වලට අවශ්‍ය ප්‍රතිකාර නොමැති වීම සම්බන්ධයෙන් 76% ක ඉහළ ප්‍රතිශතයක් ඇත. දත්තදායකයින් බාහිර ක්‍රියාකාරකම් සඳහා යොමු වීමේදී රැඳවියන් ක්‍රීඩා කටයුතු සඳහා යොමු වීමේ ප්‍රතිශතය 40% ක් වන අතර යොමු නොවීමේ ප්‍රතිශතය වන්නේ 60%කි. සංස්කෘතික කටයුතු සඳහා යොමුවීම අන් කටයුතු සඳහා යොමු වීමේ ප්‍රතිශතයට වඩා ඉහළ වන අතර එය 90% කි. ආහාර නිෂ්පාදන කටයුතු සඳහා රැඳවියන් සහභාගි වීමේ ප්‍රතිශතය වන්නේ 36%ක් වන අතර ඒ කෘෂි භෝග වගාවන්ය. වෘත්තීමය කටයුතු සඳහා රැඳවියන් යොමු වීමේ ප්‍රතිශතය වන්නේ 38% කි. බන්ධනාගාරගතව සිටින සියලුම රැඳවියන්ට කුමන හෝ වෘත්තීමය කටයුත්තක නිරතවී සිටීමට මෙහිදී හැකියාවක් නොලැබේ. වෘත්තීමය අංශවල පවතින පුරප්පාඩු අනුව රැඳවියන් යොමු කිරීම මෙහිදී සිදු කෙරේ. පවතින වෘත්තීමය අංශ ලෙස, කෘෂිකාර්මික පුහුණුව, පෙදරේරු, වඩුවැඩ, කම්මල්, ජලනල සැකසීම, මැහුම් හා ගෙතීම් අංශ, නැටුම් හා කරණවැම් අංශය හඳුනාගත හැකිය.. රැඳවියන්ගේ අධ්‍යාපන හා ආගමික කටයුතු සළකා බැලීමේදී අධ්‍යාපන කටයුතු සඳහා යොමුවීමේ ප්‍රතිශතය වන්නේ 20%කි. එය නියෝජනය කරන දත්තදායක තොරතුරුවලට අනුව වාර්තා වන්නේ සාක්ෂරතා කටයුතු විධිමත් ලෙස නොපවතින බවයි. ආගමික කටයුතු සඳහා රැඳවියන් සහභාගිවීමේ ප්‍රතිශතය ඉතාම ඉහළ වන අතර එය 100%කි. රැඳවියන්ගේ පෞද්ගලික නිදහස සළකා බැලීමේදී සිරකරු තදබදය නිසා නිදහස සීමා වීම යටතේ 80% ක් වාර්තා වේ. එහි ඇති විශේෂත්වය වන්නේ මරණීය දණ්ඩනය නියම වී ඇති සියලුම රැඳවියන් එය නියෝජනය කිරීමය. බන්ධනාගාර තුළ පවතින නෛතිකමය ක්‍රියාවලිය පිළිබඳ අදහස සළකා බැලීමේදී නීතිය සියලු රැඳවියන් කෙරෙහි එකලෙස අවධානය යොමු කිරීම සම්බන්ධව 76% ක ප්‍රතිශතයක් ඇත. 72% ක ප්‍රතිශතයක් නඩු විභාග කල් ගතවීම සමඟ එකඟ වී ඇත. එයට ප්‍රධාන හේතු ලෙස තෝරාගත් දත්තදායකයන්ට අනුව වාර්තා වූයේ ඇපිල් නඩු විභාගයන් හා මත්ද්‍රව්‍ය සම්බන්ධ නඩු විභාගයන් බහුල ලෙස කල්ගත වන බවයි. නිසිකලට නිදහස් වී යාම සම්බන්ධව 40% ක් එකඟ වන අතර 60%ක් එකඟ නොවේ. 96% ක වැඩි ප්‍රතිශතයක් සිරකරු ප්‍රජාව වැඩි වීම ගැටලු ඇති කරන බව ප්‍රකාශකර ඇත.

තෝරාගත් නියැදියෙහි නිලධාරීන්ගේ දත්ත වලට අනුව රැඳවියන්ගේ සෞඛ්‍ය හා සනීපාරක්ෂක කටයුතු පිළිබඳ නිලධාරීන්ගේ අදහස් විමසා බැලීමේදී රැඳවියන්ට පවතින වැසිකිළි පහසුකම් සළකා බැලීමේදී රැඳවියන්ට සාපේක්ෂව පවතින වැසිකිළි ප්‍රමාණවත් නොවන බවට හා වැසිකිළිවල පිරිසිදුභාවය සමඟ නිලධාරීන් 80% ක් එකඟ වී ඇත. ස්නානය කිරීමේ නිදහස සළකා බැලීමේදී 40% ක් එයට පක්ෂව කරුණු දක්වා ඇත. ඒ අතර දිනපතා ස්නානය කිරීමේ හැකියාව රැඳවියන්ට පවතින බව දත්තදායක තොරතුරු අනාවරණය කරයි. නමුත් 60% ක පිරිසක් විපක්ෂව කරුණු දක්වමින් ප්‍රකාශ කරනුයේ ස්නානය සඳහා විවිධ සීමා පැවතීම රැඳවියන්ට ගැටලු ඇති කරන බවයි. ආහාරපාන ක්‍රමවත්ව ලැබීම සම්බන්ධව 100% ක නිලධාරීන් පිරිසක් එකඟ වී ඇත. රෝගී තත්ත්වයන්ට අවශ්‍ය ප්‍රතිකාර ප්‍රමාණවත්ව ලබා නොදීම සම්බන්ධව 30%ක පිරිසකගේ එකඟතාවක් පවතී. රැඳවියන්ගේ පුනරුත්ථාපන ක්‍රියාවලිය පිළිබඳව නියැදියෙහි නිලධාරීන්ගේ දත්ත වලට අනුව රැඳවියන් බාහිර ක්‍රියාකාරකම් සඳහා යොමු වීම සළකා බැලීමේදී ක්‍රීඩා කිරීමට ඇති නිදහස 80% කි. සංස්කෘතික කටයුතු සඳහා රැඳවියන්ට නිදහස ඇති බවට නිලධාරී සියලු දෙනා එකඟ වී ඇති අතර ආහාර නිෂ්පාදන කටයුතු සඳහා සහභාගි වීම හා නොවීම සම්බන්ධව 50% ක සමාන ප්‍රතිශතයක් ගනී. දත්තදායක තොරතුරු වලට අනුව වෘත්තීමය කටයුතු සඳහා සම්බන්ධ වීමේ ප්‍රතිශතය 60% කි. රැඳවියන් සඳහා ඉගෙන ගැනීමේ නිදහස පැවතීම හා නොපැවතීම සම්බන්ධව 50% ක සමාන ප්‍රතිශතයක් වාර්තා වේ. එසේම රැඳවියන් ආගමික කටයුතු සඳහා සම්බන්ධ වීමේ ප්‍රතිශතය 100% ක බව නිලධාරීනගෙන් ලබා ගත් දත්ත අනුව පැහැදිළි වේ. මෙහිදී මහර බන්ධනාගාරයේ ඇති විශේෂිත පුනරුත්ථාපන ඒකකය තුළට රැඳවියන් යොමු කිරීම

සිදු වන්නේ පවතින පුරප්පාඩු අනුව බව ලබා ගත් දත්ත මගින් පැහැදිලි විය. ඒ අනුව පුනරුත්ථාපන ඒකය මගින් පුනරුත්ථාපනය වන ප්‍රතිශතය 20%කි. බන්ධනාගාර පරිපාලනය පිළිබඳව නිලධාරීන්ගෙන් දත්තලබා ගැනීමේදී රැඳවියන් කෙරෙහි නිලධාරීන් එකලෙස කටයුතු කිරීම සම්බන්ධව 100% ක ප්‍රතිශතයක් එකඟ වී ඇත. එසේම පවතින ගොඩනැගිලි පහසුකම් ප්‍රමාණවත් නොවන බවට දත්තදායකයන් සියලු දෙනා එකඟ වී ඇත.

සිරකරු ප්‍රජාව වැඩි වීම පරිපාලන කටයුතු සඳහා බලපාන ආකාරය සම්බන්ධව කරුණු විමසීමේදී දත්තදායක තොරතුරු වලට අනුව පැහැදිලි වන්නේ රැඳවියන්ගේ තදබදය නිලධාරීන් හට කායික හා මානසික ව්‍යාකූලතා ඇති කරන බවත්, වැඩිවන සිරකරුවන්ට සාපේක්ෂව නිලධාරීන් සේවයේ නොමැති වීම මත ඉහළ පෙළ නිලධාරීන්ගේ පීඩනයට ලක්වන බවයි. සිරකරුවන්ගේ පුනරුත්ථාපනය පිළිබඳව නිලධාරීන්ගෙන් අදහස් විමසීමේදි පැහැදිලි වන්නේ බන්ධනාගාරගත කරන සිරකරුවන්ගෙන් වැඩි ප්‍රමාණයකගේ චරිතශෝධනය නොවන බවත් පුනරුත්ථාපන අංශය තුළ පවතින ඉඩපහසුකම් අවම වීම මත රැඳවියන් තෝරා ගැනීමට ලක් වීම හේතුවෙන් සෑම රැඳවියෙක්ම එයට යොමු කිරීමට නොහැකි වීම ගැටලු සහගත වීම බවයි. වෘත්තීමය අංශ සඳහා වුවද වැඩි රැඳවියන් ප්‍රමාණයක් සම්බන්ධ කර ගැනීමට නොහැකි වන්නේ , එයට අවශ්‍ය ප්‍රතිපාදන නිසිකලට නොලැබීම මතය., සිරකරුවන් අපරාධය අනුව වර්ග කිරීමට අවශ්‍ය ඉඩපහසුකම් නොමැති වීම මත ඇතැම් අවස්ථාවන්වල පුද්ගල අපරාධකාරීත්වය ඉහළ යන බව නිලධාරීන්ගේ දත්ත අනුව ගම්‍ය වේ. බන්ධනාගාර නෛතිකමය ක්‍රියාවලිය කෙරෙහි නිලධාරීන්ගෙන් දත්ත ලබා ගැනීමේදී නීතිය රැඳවියන් කෙරෙහි එකලෙස අවධානය යොමු කරන බව 70% ක් ප්‍රකාශ කරන අතර එයට විරුද්ධව 30% ක ප්‍රතිශතයක් ඇත. නඩු විභාගයන් කල් යාම සම්බන්ධව 80% ක් එකඟවී ඇත. ඒ අතර ඇපිල් නඩු කල් යන බවට දත්තදායකයන් විසින් ප්‍රකාශ කරන ලදි. රැඳවියන්ට නිසි කලට නිදහස් වීමට සුදුසු වැඩපිළිවෙළක් නොපවතින බව 70% ක එකඟතාවක් පවතී. සිරකරු ප්‍රජාව වැඩිවීම ගැටලු ඇති කරන බවට 100% ක ප්‍රතිශතයක් එකඟ වී ඇත.

## 4. නිගමන සහ නිර්දෙශ

මෙම පර්යේෂණයේ සොයාගැනීම් අනුව බන්ධනාගාර තුළ පවතින පුනරුත්ථාපන ගැටලු සඳහා සෘජුවම බලපෑම් කරනු ලබන්නේ සිරකරු ජනගහනය වැඩි වීමය. එම නිසා පුනරුත්ථාපන කටයුතු නිසිලෙස ඉටු කිරීමට පරිපාලනය අපහොසත් වී ඇත. බන්ධනාගාර තුළ පුනරුත්ථාපන කටයුතු සාර්ථකව ක්‍රියාත්මක නොවීම සඳහා පරිපාලන දුර්වලතාවන් මෙන්ම රැඳවියන්ගේ දුර්වලතාවන් ප්‍රබල ලෙස පැවතීම මත මෙම ගැටලුව අවම කිරීමට පවතින හැකියාව දුර්වල වන බව හඳුනාගත හැකිය.අධ්‍යයන ප්‍රතිඵල මගින් සනාථ වන පරිදි බන්ධනාගාර තුළ සිරකරු අධිගහනය සඳහා බලපාන සාධක අතර රිමාන්ඩ් සිරකරු ප්‍රමාණය ඉහළ යාමය. එසේම රැඳවියන්ගේ අපරාධකාරීත්වය සළකා බැලීමේදී මත්ද්‍රව්‍ය භාවිතය මූලික හේතු බීජය වී ඇත. පුනර් බන්ධනාගාරගත වීම සැලකිය යුතු මට්ටමක පවතින අතර රිමාන්ඩ් සිරගත වූවන් එහිදි වැඩි ප්‍රතිශතයක් ගනී. රැඳවියන් බන්ධනාගාරගත කිරීමේදි කිසිදු වර්ගීකරණයකට අනුගත නොකිරීම පුද්ගල අපරාධකාරීත්වය ඉහළ යාමට හේතු වේ. එසේම වැඩිවන සිරකරුවන්ට සාපේක්ෂව පවතින ගොඩනැගිලිවල ඉඩ සීමිත වීම මත රැඳවියන් සිරකුටි තුළදී කායික, මානසික අපහසුතාවයන්ට ගොදුරු වේ. රැඳවියන්ගේ පුනරුත්ථාපන ක්‍රියාවලියට අදාළ වන සෞඛ්‍ය හා සනීපාරක්ෂක කටයුතු කෙරෙහි අවධානය යොමු කිරීමේදි සිරකරු අධිගහනය සෞඛ්‍ය හා සනීපාරක්ෂාව සීමිත කොට ඇත. ඒ අනුව වැඩිවන සිරකරුවන්ට සාපේක්ෂව වැසිකිළි ප්‍රමාණවත් නොවීම,බන්ධනාගාර රෝහලේ ඇති ඖෂධ ප්‍රමාණවත් නොවීම මෙන්ම රැඳවියන් බාහිර රෝගී සායනයන් සඳහා යොමු කිරීම සඳහා සිටින නිලධාරී පිරිස ද සීමිත වේ. වාට්ටු තුළ ශීඝ්‍රයෙන් බෝවන රෝගී තත්ත්වයන් ලෙස ක්ෂය රෝගය, දද, කුෂ්ඨ, මෙන්ම අවිධිමත් ලිංගික චර්යා ඇති කර ගැනීම මත බෝවන ලිංගික ඉන්නන් ආදී රෝගී තත්ත්වයන් රැඳවියන්ගේ සෞඛ්‍ය දුර්වල කොට ඇත. රැඳවියන්ගේ බාහිර වැඩකටයුතුවල ඵලදායීතාව සළකා බැලීමේදි, ඔවුන් විවිධ වෘත්තීය අංශ වෙත යොමු කරනු ලබන්නේ ඔවුනගේ හැකියාව මත නොව වෘත්තීය අංශයේ පවතින පුරප්පාඩු අනුවය. රැඳවියන්ට සාපේක්ෂව වෘත්තීය අංශවල පවතින සීමිත ඉඩ ප්‍රස්තාවන් හේතු කොට ගෙන දණ්ඩන කාලය නිමාවන තෙක්ම ඔවුන්ට එකම කාර්යයක නිරත වීමට සිදුව ඇත. අවශ්‍ය ප්‍රතිපාදන නොමැති විම මත මේ වන විටත් බේකරි අංශය ඉවත් කොට ඇත. රැඳවියන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා විධිමත් ක්‍රමවේදයක් නොමැතී වීම මත ඒකී අවස්ථාවන්ද මේ වන විට නතර වී ඇත. එසේම බන්ධනාගාරය තුළ පවතින පුනරුත්ථාපන ඒකකයට හා මත්ද්‍රව්‍ය පුනරුත්ථාපන ඒකකයට රැඳවියන් විශේෂ තෝරා ගැනීමකට ලක් වන්නේද වැඩිවන රැඳවියන්ට සාපේකෂව පවතින ඉඩ සීමිත වීම නිසාය. රැඳවියන් බන්ධනාගාරගත වීමේදි අධිකරණය හා බන්ධනාගාරය අතර කිසිදු අන්තර් සම්බන්ධතාවක් නොමැති වීම හේතුවෙන් ලබා දෙන අධිකරණ විනිශ්චයන් මත බන්ධනාගාර පරිපාලනයේ ගැටලු ඇති කරයි. එහිදි මූලික කරුණ බවට පත්ව ඇත්තේ, අධිකරණය විසින් නඩු විභාගයන් විසඳීම කල් යැවීමය. එසේම සුළු අපරාධකරුවන් හා මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වූවන් බන්ධනාගාරගත කිරීම මත නිතැතින්ම සිරකරු ජනගහනය වැඩි වේ. විශේෂයෙන්ම ඇපිල් නඩු ඉතා ප්‍රබල ලෙස ප්‍රමාද තත්ත්වයක පවතී. එසේම දිනෙන් දින රිමාන්ඩ් සිරකරුවන්ගේ ප්‍රමාණය ඉහළ යන්නේද, අධිකරණය හා බන්ධනාගාරය තම කටයුතු විශ්ලේෂණය

නොකිරීම මත, ලබා දෙන අධිකරණය නඩු තීන්දු වල ප්‍රතිඵල හේතුවෙනි. එසේම වැඩිවන රැඳවියන්ට සාපේක්ෂව බන්ධනාගාරය තුළ පවතින භෞතික සම්පත් මෙන්ම මානව සම්පත්වල හිඟයක් පවතී. ඒ හේතුවෙන් පුනරුත්ථාපන ගැටලු බන්ධනාගාරය තුළ පැන නැගී ඇත. අධ්‍යයනයේ ප්‍රතිඵල වලට අනුව මෙම කරුණුවලට විපක්ෂවද අදහස් ඉදිරිපත් වී ඇත. එනම් බන්ධනාගාරය ස්වාධීන ආයතනයක් ලෙස ක්‍රියාත්මක වන අතර පරිපාලන නිලධාරීන් කිසිදු ආකාරයේ අනිසි බලයක් රැඳවියන් කෙරෙහි යොමු නොකිරීම මත රැඳවියන්ට ස්වාධීන ලෙස කටයුතු කිරිමට හැකියාව ලැබී ඇත. එසේම රැඳවියන් උදෙසා ක්‍රියාත්මක වන ආගමික වැඩසටහන් මගින් ඔවුන්ගේ අධ්‍යාත්මය දියුණු වන අතර සීල ව්‍යාපාර, භාවනා වැඩසටහන්, දානමය වැඩසටහන් ක්‍රියාත්මක වේ. එසේම රැඳවියන්ට සංස්කෘතික කටයුතු සඳහා සහභාගී වීමට පූර්ණ නිදහසක් ඇත. නමුත් පුනරුත්ථාපනය වූ කලී එක් පැතිකඩකට පමණක් සීමා නොවන්නකි. එය පුළුල් ක්‍රියාදාමයකි. එබැවින් සමස්ත විශ්ලේෂණය පරිශීලනයෙන් ගම්‍යමාන වන්නේ, බන්ධනාගාර ආශ්‍රිතව නිර්මාණය වී පවතින සිරකරු අධිගහනය පුනරුත්ථාපන ගැටලු ඇති කිරීම සඳහා සෘජු ලෙස බලපෑම් ඇති කරන බවයි. මෙම සියලු සාධකයන්ගේ අවසන් ප්‍රතිඵලය ලෙස බන්ධනාගාර පද්ධතිය තුළ සිරකරු අධිගහනය හේතුවෙන් නිර්මාණය වන පුනරුත්ථාපන ගැටලු තවමත් විසඳුම් සෙවීමට දුෂ්කර වූ ගැටලුවක් බවට පත්ව ඇති බව ගම්‍ය වේ.

බන්ධනාගාර තුළ පසු විපරමක් පවතින්නේ නම් දණ්ඩන කාලසීමාවෙන් පසු සමාජගතවන පුද්ගලයා නැවත අපරාධ සඳහා යෙමුවීමේ ප්‍රවණතාව අවම කරගත හැකිය. යම් පුද්ගලයෙකුගේ දණ්ඩන කාල සීමාව අවසන් කළ පසු ඔහු සමාජයට අනුගත වූ විට බන්ධනාගාරය විසින් යම් කාලපරිච්ඡේදයක් අදාළ පුද්ගලයාගේ චර්යාව නිරීක්ෂණය කළ යුතුව පවතී. එමගින් පුද්ගලයාගේ අවිධිමත් චර්යයාව විවිධ සීමාවන් වලට යටත් වීම සිදුවන බැවින් පුද්ගලයා නැවත අපරාධ සිදු කිරීමට පෙළඹෙන ප්‍රමාණය අවම වේ. එමෙන්ම බන්ධනාගාරය විසින් පුද්ගලයා නිරීක්ෂණය කරන බව අදාළ පුද්ගලයාට ඒත්තු ගැන්වීම මෙහිදි සිදු කළ යුතු අතර මේකි අධීක්ෂණය යටතේ අදාළ පුද්ගලයාගේ ආර්ථික හා සමාජ තත්ත්වයද විමසීමට ලක් කළ යුතුය. සමාජගත වන පුද්ගලයා තම චර්යයාවන් පිළිබඳව බන්ධනාගාරය අධීක්ෂණයෙන් පසුවන බව දැනුවත් වීම මත ඔහු නැවත අපරාධ සඳහා යොමු වන ප්‍රවණතාව අවම වේ.

බන්ධනාගාරය හා අධිකරණය අතර මනා අන්තර් සබඳතාවක් ගොඩ නැගීම මගින් බන්ධනාගාර තුළ පවතින රැඳවියන්ගේ තදබදය සීමා කළ හැකිවනු ඇත. එමගින් බන්ධනාගාරය තුළ පවතින භෞතික සම්පත් හා මානව සම්පත් වල හීන විම මත ඇති වන පුනරුත්ථාපන ගැටලු පිළිබඳව අධිකරණ තුළද අවබෝධයක් ඇති වේ.

රැඳවියන් අපරාධය අනුව වර්ගීකරණයට ලක් කිරීම මගින් අපේක්ෂා කරනු ලබන්නේ රැඳවියන් බන්ධනාගාරය තුළදී නව අපරාධකාරී චර්යාවන් ඇති කර ගැනීම වැළැක්වීමය. නමුත් වර්තමාන බන්ධනාගාර පද්ධතිය මෙම ක්‍රමයට අනුගත නොවේ. එහිදි රැඳවියන් අපරාධය අනුව වර්ගීකරණයක් සිදු නොකරයි. බරපතල හා සුළු අපරාධකරුවන් වෙන් නොකිරීම මත රැඳවියන් බන්ධනාගාරය තුළ සිටම නව අපරාධ ඉගෙන ගැනීමත්, අපරාධ සිදු කිරීමට අවශ්‍ය භෞතික හා මානව සම්පත් තම සිරකුටිය තුළින්ම සපයා ගැනීමත් සිදු වේ. මෙම තත්ත්වය රැඳවියන්ගේ පුනරුත්ථාපන ක්‍රියාවලියද අභියෝගයට ලක් කරයි. අපරාධය අනුව වර්ගීකරණයකට යටත්ව සිරගතකරන්නේ නම් වඩා ඵලදායී බව ලබා ගත් දත්ත අනුව ගම්‍ය විය.

වර්තමාන බන්ධනාගාර තුළ රඳවා සිටින රැඳවියන්ගෙන් වැඩි දෙනෙකු මත්ද්‍රව්‍ය සඳහා බන්ධනාගාරගත වූවන්ය. එය රිමාන්ඩ් සිරකරුවන් මෙන්ම දඬුවම් විඳින සිරකරු ප්‍රජාව නිතැතින්ම ඉහළ යාම සඳහා ප්‍රබල බලපෑමක් ඇති කරයි. එසේම රැඳවියන් අපරාධය අනුව වර්ගීකරණයකට යටත් නොකරන හෙයින් මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වූවන් මෙහිදි විවිධ අපරාධ සඳහා යොමු වීමේ වැඩි ප්‍රවණතාවක් පවතී. පුනර් බන්ධනාගාරගත වීම සළකා බැලීමේදී වැඩි ප්‍රතිශතයක් වාර්තා වන්නේ මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වූවන්ය. මෙකී තත්ත්වය අවම කිරිම සඳහා මත්ද්‍රව්‍ය භාවිතය සඳහා ඇබ්බැහි වූවන් බන්ධනාගාරගත නොකොට පුනරුත්ථාපනය කිරීම සඳහා වෙනම පුනරුත්ථාපන ආයතන සඳහා යොමු කිරීම සුදුසු බව ලබාගත් දත්තවලට අනුව පැහැදිළි විය.

සිරකරුවන් බන්ධනාගාරගත කිරීමෙන් පසුව පුනරුත්ථාපන ක්‍රියාදාමය තුළ පවතින වෘත්තීය පුනරුත්ථාපනය ලබා දීම සිදු වේ. මෙම වෘත්තීය පුනරුත්ථාපනය ලබා දිය යුතු වන්නේ වඩා ඵලදායී ආකාරයටය. එනම් රැඳවියන්ගේ දක්ෂතාවන් හදුනා ගෙන ඔවුන් සුදුසු වෘත්තීය අංශයක් වෙත යොමු කළ යුතුය. එකී වෘත්තීය පුහුණුව අදාළ පුද්ගලයා දණ්ඩන කාල සීමාවෙන් පසුව සමාජගත වූ විට ඔහුගේ ආර්ථිකය ශක්තිමත් කිරිමට උත්සුක වීමද අවශ්‍ය වන්නකි . නමුත් වර්තමාන බන්ධනාගාරයන් තුළ සිදුවන වෘත්තීය පුහුණුව දක්ෂතාව හඳුනාගෙන නොව වෘත්තීය අංශවල පවතින අඩුපාඩු සම්පූර්ණ කිරීම සඳහා පමණක් රැඳවියන් යොදවයි. එය ඵලදායී නොවේ. ඒ අනුව බන්ධනාගාරයන් තුළ පවතින වෘත්තීය අංශ වැඩි දියුණු කරමින් දක්ෂතාව , හැකියාව හදුනා ගෙන රැඳවියන් සුදුසු ඵලදායී වෘත්තීය පුහුණුවක යෙදවීම සිදු කිරීම මගින් පුනරුත්ථාපනය ගැටලු අවම වනවා සේම ඔවුන් සමාජගත වූ විට අපරාධ සිදු නොකර වෘත්තියක නිරත වීමට ද හැකි වනු ඇති බව දත්තදායකන් විසින් යෝජනා කරන ලදි.

වර්තමාන බන්ධනාගාරයන් තුළ පවතින මූලික ගැටලුවක් වන සිරකරුවන්ගේ අධිගහනය සඳහා බලපාන මූලික සාධකයක් ලෙස සුළු අපරාධකරුවන් බන්ධනාගාරගත කරවීම ඉතා ඉහළ මට්ටමක පවතී. සුළු අපරාධකරුවන් බන්ධනාගාරගත නොකර විකල්ප දඬුවම් ක්‍රම සඳහා යොමු කිරීම සිදු කළ හැකිය. ශ්‍රමදාන සඳහා සහභාගී කරවීම, මාර්ග පද්ධතීන් ඉදි කිරීම වැනි රටේ සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා අවශ්‍ය මානව ශ්‍රමය ලබා ගැනීම සඳහා යොමු කරවීම ඒ සඳහා නිදසුන් කිහිපයකි. මෙමගින් රැඳවියන් බන්ධනාගාර උපසංස්කෘතියට අනුගත නොවන අතර සමාජය තුළ විධිමත්ව ක්‍රියා කිරීම මගින් ඔවුන්ගේ අපරාධකාරීත්වය අවම වේ.

## 5. ආශ්‍රිත ග්‍රන්ථ


උදයකුමාර, සී. (2016). බන්ධනාගාරගත වූවන් පුනරුත්ථාපනය හා ප්‍රජාපාදක විශෝධනය, අත්පත්‍රිකාවකි.

ජයසුන්දර, එම්. ඩබ්. (2015). සමාජීය විද්‍යා පර්යේෂණ ක්‍රම. නුගේගොඩ: සාරංගි ප්‍රින්ටස්.

දස්කොන්, එන් සහ පෙරේරා, එස්. (2017). *පනිට්ටුවට වැසිකිලි යන වැලිකඩ බෝඩිං ජීවිත.* නුගේගොඩ: කතෘ ප්‍රකාශන.

ප්‍රජා පාදක විශෝධන පනත, (1999). රාජ්‍ය මුද්‍රණ සංස්ථාව.

බන්ධනාගාර පාලන වාර්තාව, (2018). රාජ්‍ය මුද්‍රණ සංස්ථාව.

Ejibunu, A. F. (2013). *An Ev aluative Reserch of Mental Health, Adju stment Problem and Post Release Life Expectation of Inmates in AGODI Prison*, 63(10), 23-24. Retrieved from https://www.ncbi.nlm.nih.gov/pmc/articles/PMC3237124/

Jeewanthi, M. K. G. (2015). *Srilankan prison system; conflict with human rights standards*, 15 (2), 2. Retrieved from. https://journals.sjp.ac.lk/index.php/IRCHS/article/view/2289/1261

Jonathan. P. and Lee. A (2017). *Improving In-Prison Rehabilitation Programs,* 10(1), 22-23. Retrieved form https://lao.ca.gov/Publications/Report/3720

Karunarathne, L. J. M. (2015). *prisoner's rehabilitation in sri laknka*. 7(29), 1-12. Retrieved from https://economynext.com/sri-lanka-looking-to-use-prisoners-rehabilitation-centre-inmates-for-agri-work-96957/

Kristine, M. (2015). *Exploring prison drug use in the context of prison-based drug* 23 (2),5 Retrieved form https://www.tandfonline.com/doi/full/10.3109/09687637.2015.1136265

Oscar, G, (2015). *Criminologists in corrections: an assessment and understanding of gang involvement and related behaviour,* 10(3), 10. Retrieved form https://journals.co.za/doi/abs/10.10520/EJC183338

Reid, S. (2012). *Tuberculosis and HIV Control in Sub-Saharan African Prisons.* 205 (02), 5 Retrived form https://academic.oup.com/jid/article/205/suppl_2/S265/804473?view=extract

Stephen, D. (1991). *Intravenous drug misuse among prison inmates: implications for spread of HIV.* 302(22*)*, 20-24. Retrieved form https://www.ncbi.nlm.nih.gov/pmc/articles/PMC1670217/pdf/bmj00131-0038.pdf

Prison Statistics of Sri Lanka, (2019). Retrieved form http://prisons.gov.lk/old_web/Statistics/Statistics-2019.pdf

Punjab Prison, (2018). Retrieved from https://www.punjabprisons.org/

United Nations Human Right Council, (1990). Retrieved form https://sgp.fas.org/crs/row/RL33608.pdf